**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල**

ශ්‍රේණිය : 6

විෂය : ගණිතය

සතිය : 11

**පාඩම :- සාධක හා ගුණාකාර**

**කාලච්ඡේද ගණන :- 09**

- පෙළපොතේ 137,138 පිටු හොඳින් අධ්‍යයනය කරන්න. දී ඇති පුටු 6 පේළි හා තීර ලෙස පිළියෙල කර ඇති ආකාරය බලන්න.

ඒ අනුව 6 ලබා ගත හැකි ආකාර සංඛ්‍යා දෙකක ගුණිතයක් ලෙස පහත පරිදි ලැබෙන බව හඳුනාගන්න.

$6 = 1 \times 6$

$6 = 2 \times 3$

$6 = 3 \times 2$

$6 = 6 \times 1$

- 138 පිටුව බලන්න. එහි සඳහන් පරිදි පුටු 12 ඉහත ආකාරයට පිළියෙල කිරීමේදී පුටු 12 ලැබෙන ආකාරය සංඛ්‍යා දෙකක ගුණිතයක් ලෙස පහත පරිදි හඳුනාගන්න.

$12 = 1 \times 12$

$12 = 2 \times 6$

$12 = 3 \times 4$

$12 = 4 \times 3$

$12 = 6 \times 2$

$12 = 12 \times 1$

- මෙලෙස පහත දැක්වෙන සංඛ්‍යා , සංඛ්‍යා දෙකක ගුණිතයක් ලෙස ලිවිය හැකි ආකාර ලියන්න.

1) 18 2) 24 3) 30 4) 40

කිසියම් පූර්ණ සංඛ්‍යාවක් , පූර්ණ සංඛ්‍යා දෙකක ගුණිතයක් ලෙස ලියූ විට ඒවා එක එකක් මුල් සංඛ්‍යාවේ සාධක වේ.

16 හි සාධක ලිවීමේදී 16 ට අදාල පහත ගුණිතයන් පමණක් ප්‍රමාණවත් බව හඳුනාගන්න.

| <u>සියලු ගුණිත</u> | <u>ප්‍රමාණවත් ගුණිත</u> |
|---|---|
| $16 = 1 \times 16$ | $16 = 1 \times 16$ |
| $16 = 2 \times 8$ | $16 = 2 \times 8$ |
| $16 = 4 \times 4$ | $16 = 4 \times 4$ |
| $16 = 8 \times 2$ | |
| $16 = 16 \times 1$ | |

එම නිසා, 16 හි සාධක = 1, 2, 4, 8, 16

- 20 හි සාධක

$20 = 1 \times 20$
$20 = 2 \times 10$
$20 = 4 \times 5$

එම නිසා, 20 හි සාධක = 1, 2, 4, 5, 10, 20

**0, කිසිදු පූර්ණ සංඛ්‍යාවක සාධකයක් ලෙස නො ගැනේ.**

පෙළපොතේ 139 පිටුවේ 11.1 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න. ඔබට මතුවන ගැටළු ගණිත ගුරුභවතා සමඟ සාකච්ඡා කරන්න.

- 140 පිටුව නිවැරදිව අධ්‍යයනය කරන්න. දී ඇති ගුණන වගුව හොඳින් අධ්‍යයනය කරන්න.
- සංඛ්‍යාවක් සාධක දෙකක ගුණිතයක් ලෙස ලියා එම සාධක හඳුනා ගන්න.

ගුණන වගුව භාවිතයෙන් පහත සංඛ්‍යාවල සාධක ලියන්න.

1) 14 2) 20 3) 30 4) 32

පෙළපොතේ 141 පිටුවේ 11.2 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න. ඔබට මතුවන ගැටළු නිවැරදි කර ගැනීමට උත්සහ කරන්න.

<u>**බෙදීමේ ක්‍රමය මඟින් සාධක සෙවීම**</u>

146, 147 පිටු හොඳින් කියවන්න. සංඛ්‍යාවක් පූර්ණ සංඛ්‍යාවකින් ඉතිරි නොමැතිව බෙදෙන අවස්ථා නිරීක්ෂණය කරන්න.

උදා:-

16 ÷ 8 15 ÷ 8

$$\begin{array}{r|l} & \ \ 2 \\ \hline 8 & 16 \\ & \underline{16} \\ & \ \ 0 \end{array} \qquad \begin{array}{r|l} & \ \ 1 \\ \hline 8 & 15 \\ & \ \ \underline{8} \\ & \ \ 7 \end{array}$$

16 ÷ 8 = 2 ඉතිරි 0

15 ÷ 8 = 1 ඉතිරි 7

| |
|---|
| යම් පූර්ණ සංඛ්‍යාවක්, පූර්ණ සංඛ්‍යාවකින් ඉතිරි නැතිව බෙදේ නම් එම සංඛ්‍යාව මුල් සංඛ්‍යාවේ සාධකයක් වේ. |

- 16, 8න් ඉතිරි නැතිව බෙදේ. එමනිසා 8, 16 හි සාධකයක් වේ.
- 15, 8න් ඉතිරි නැතිව නො බෙදේ. එමනිසා 8, 15 හි සාධකයක් නො වේ.

143 පිටුව බලන්න. 11.3 අභ්‍යාසය සම්පූර්ණ කරන්න. ඔබට මතුවන ගැටළු නිවැරදි කරගන්න.

143 පිටුව හොඳින් අධ්‍යයනය කරන්න. සංඛ්‍යාවක ගුණාකාර යනු කුමක්දැයි නිවැරදිව අවබෝධ කරගන්න.

| |
|---|
| සංඛ්‍යාවක් තවත් පූර්ණ සංඛ්‍යාවකින් ගුණ කිරීමෙන් එම සංඛ්‍යාවේ ගුණාකාර ලබාගත හැකිය. |

උදා:-

3 × 1 = 3

3 × 2 = 6

3 × 3 = 9

3 × 4 = 12

මෙලෙස 3 හි ගුණාකාර 3, 6, 9, 12, 15, ... වේ.

- පහත දැක්වෙන සංඛ්‍යාවල මුල් ගුණාකාර 5 ලියන්න.

1) 5 2) 7 3) 10 4) 12 5) 15

පෙළපොතේ 144 පිටුවේ ක්‍රියාකාරකම 1 නිවැරදිව සම්පූර්ණ කරන්න.

පෙළපොතේ 145 පිටුවේ 11.4 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.

- 146 පිටුව හොඳින් අධ්‍යයනය කර ගුණාකාර ආශ්‍රිත නිදසුන 1 ගැටළුව නිවැරදිව අධ්‍යයනය කරන්න.

  146 පිටුවේ නිදසුන 1 අනුව 147 පිටුවේ 11.5 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.

සංඛ්‍යාවක් 2 න් 5 න් හා 10 න් ඉතිරි නැතිව බෙදේදැයි සෙවීමේ හැකියාව තහවුරු කර ගැනීමට 148 පිටුව හොඳින් අධ්‍යයනය කරන්න.

> සංඛ්‍යාවක එකස්ථානයේ ඉලක්කම 2 න් ඉතිරි නැතිව බෙදේ නම් එම සංඛ්‍යාව 2න් හරියටම බෙදේ.

උදා:- 348 | 347

$$\begin{array}{r|l} & 4 \\ \hline 2 & 8 \\ & \underline{8} \\ & 0 \end{array} \qquad \begin{array}{r|l} & 3 \\ \hline 2 & 7 \\ & \underline{6} \\ & 1 \end{array}$$

8, 2න් හරියටම බෙදේ. | 7, 2න් හරියටම නො බෙදේ.

එම නිසා, 348 2න් හරියටම බෙදේ. | එම නිසා, 347 2න් හරියටම නො බෙදේ.

පහත දැක්වෙන සංඛ්‍යා 2න් හරියටම බෙදෙන, 2න් හරියටම නො බෙදෙන බව එකස්ථානයේ ඉලක්කම අනුව හඳුනාගෙන පහත කොටු පුරවන්න.

48, 53, 87, 60, 68, 72,

78, 80, 81, 83,90,85,

98, 100,103, 107,

106, 200, 205, 210,

300, 348, 375, 400,

402, 500

2න් හරියටම බෙදෙන

2න් හරියටම නො බෙදෙන

> සංඛ්‍යාවක එකස්ථානයේ ඉලක්කම 0 හෝ 5 වේ නම් එම සංඛ්‍යාව 5න් ඉතිරි නැතිව බෙදේ.

උදා:-

$$\begin{array}{r|l} & 15 \\ \hline 5 & 75 \\ & \underline{5} \\ & 25 \\ & \underline{25} \\ & 0 \end{array} \qquad \begin{array}{r|l} & 16 \\ \hline 5 & 80 \\ & \underline{5} \\ & 30 \\ & \underline{30} \\ & 0 \end{array}$$

75, 5න් ඉතිරි නැතිව බෙදේ. | 80, 5න් ඉතිරි නැතිව බෙදේ.

එකස්ථානයේ ඉලක්කම සලකමින් පහත සංඛ්‍යා 5 න් ඉතිරි නැතිව බෙදේ දැයි ලියන්න.

1) 120 2) 105 3) 252 4) 343

| |
|---|
| සංඛ්‍යාවක එකස්ථානයේ ඉලක්කම 0 වේ නම් එම සංඛ්‍යාව 10න් ඉතිරි නැතිව බෙදේ. |

```
      10                 34
10 | 100          10 | 340
   | 10              | 30
     00                 40
     00                 40
      0                  0
```

100, 10න් ඉතිරි නැතිව බෙදේ. 340, 10න් ඉතිරි නැතිව බෙදේ.

```
      12
10 | 125
   | 10
      25
      20
       5
```

125, 10න් ඉතිරි නැතිව නො බෙදේ.

පහත දැක්වෙන සංඛ්‍යා අතරින් 10න් ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යා තෝරා ලියන්න.

50, 65, 80, 87, 100,90, 105, 110,150, 99, 145, 120, 130, 200, 208

පෙළපොතේ 149, 150, 151 පිටු නිවැරදිව අධ්‍යයනය කරන්න.

පෙළපොතේ 149 පිටුවේ 11.6 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.

- 150 පිටුවේ මිශ්‍ර අභ්‍යාසය අමතර අභ්‍යාසයක් ලෙස නිවැරදිව සම්පූර්ණ කරන්න.

- 151 පිටුවේ ඇති පාඩමේ සමස්ත සාරාංශය හොඳින් අධ්‍යයනය කරන්න.